මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB)

# තනතුරු ඇබෑර්තු

විවිධ විෂයයන් පිළිබඳ පුළුල් විශේෂඥතා පරාසයක් සහිත ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රමුඛ පෙළේ ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙහි පුරප්පාඩුව පවතින විදුලි යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## විදුලි යන්ත්‍ර ක්‍රියාකරු (PL - 2)

**සුදුසුකම් :**

සිංහල / දෙමළ සහ ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත් විය යුතුය. එක්වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්විය යුතුය.

සහ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) හෝ පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද අදාළ ක්ෂේත්‍රයේ NVQ 2-3 මට්ටමට නොඅඩු, මාස 06 කට නොඅඩු (පැය 720 ට නොඅඩු) සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම.

**පළපුරුද්ද :**

වසර 02 ක අවම පළපුරුද්ද තිබිය යුතුය.

**වයස :** අවුරුදු 20 – 45 අතර විය යුතුය.

තෝරාගනු ලබන අයැදුම්කරුවන් සුදුසුකම් හා පළපුරුද්ද මත සුදුසු වැටුප් පියවරක පිහිටුවනු ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

i. මාසික දිරි දීමනා ඇතුළත් ආකර්ෂණීය අතිරේක දීමනා පැකේජයක් ලබාදෙනු ඇත.

ii. කාර්යාංශය විසින් වැටුපෙන් 12% සහ 3% දායක මුදලක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේද :**

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කුසලතා අනුපිළිවෙළ අනුව තෝරාගැනීම සිදු කරනු ලැබේ.

නවාතැන් පහසුකම් ආයතනය මඟින් සපයනු ලැබේ. සුදුසුකම් සහිත අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය 2017-03-20 දින හෝ ඊට ප්‍රථම අදාළ සහතික පත්‍රවල ඡායා පිටපත් සහිතව ලියාපදිංචි තැපෑලෙන් සාමාන්‍යාධිකාරී, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, නො. 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනයට ලැබීමට සළස්වන මෙන් දන්වමි.

**සභාපති,**

**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය**